**කොළඹ විශ්වවිද්‍යාලය - 2015**

**----------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලයේ **2015** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත **2015** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **107(5)** උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(1)** ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගණුදෙනු හෙළිදරව් නොකිරීම

------------------------------------------------------------------------

ආයතනය තුළ සමාගමක් ආරම්භ කිරීමට පෙර කැබිනට් අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව සමාගම් පනත යටතේ 2013 වර්ෂයේ දී කලම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් **(Colombo Science & Technology Cell)** නමින් ඇපයෙන් සීමිත සමාගමක් ලියාපදිංචි කර තිබුණි. මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකඟතා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු.294,763 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

### 2.2.3 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.611,787,370 ක වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවලංගු කරන ලද චෙක්පත් වල වටිනාකම් අදාල වර්ෂයේදී ආදායමට බැර කල යුතු වුවත් 2015 වර්ෂයේදී එකතු වටිනාකම රු.177,723 ක් වූ උපාධි අධ්‍යයන පීඨයෙහි අවලංගු කල චෙක්පත් ආදායමට බැර නොකොට එම පීඨය විසින් පවත්වාගෙන යනු ලබන පීඨ සංවර්ධන අරමුදලට බැර කර තිබුණි.

(ආ) ශිෂ්‍ය කණ්ඩායම් 45 කට අදාල පාඨමාලා 2014 වර්ෂය තුළදී අවසන් කර තිබූ නමුත් ආදායම් අතිරික්තය වූ රු 85,593,750 ක් සමුච්චිත අරමුදලට බැර කිරීමකින් තොරව රු.31,353,952 ක් පීඨ සංවර්ධන අරමුදලට බැර කර ඉතිරිය වූ රු.54,239,798 ක් විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

පහත දැක්වෙන ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| ලංකා විදුලිබල මණ්ඩලයේ තැන්පතු | 1,301,500 | අදාල බිල්පත් හෝ වෙනත් තහවුරු ලේඛන |
| ඉඩම් | 35,296,230 | හිමිකම් ඔප්පු |
| ආපදා ණය | 4,184,905 | උපලේඛන |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

උත්සව අත්තිකාරම් මුදල් ලබාදුන් දින සිට මාස 10 ක් තුල අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකර ගතයුතු වුවත් 2015 වර්ෂයට පෙර ලබාදී තිබූ රු.179,100 ක අත්තිකාරම් ශේෂ ගිණුම් වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණු අතර අයකර නොගැනීමට හේතු වූ කරුණු හා හිඟ අත්තිකාරම් සඳහා කාල විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති වැටුප් හා දීමනා වලට අමතරව මහා භාණ්ඩාගාරයෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධිමත් අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා ආදායමින් 2014 හා 2015 වර්ෂ වලදී පිළිවෙලින් රු.2,060,300ක් සහ රු.5,443,800 ක් ආයතනයේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් වෙත ගෞරව දීමනාවක් (**Honorarium Payments**) ලෙස ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යයන පීඨයන්හි පවත්වනු ලබන පීඨ මණ්ඩල රැස්වීම් හා අධ්‍යයනාංශයන්හි පවත්වනු ලබන අධ්‍යනාංශ රැස්වීම් හෝ අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවන සාමාජිකයන් වෙනුවෙන් සහභාගීත්ව දීමනාවක් ගෙවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ මගින් අනුමැතියක් ලබාදී නොතිබියදී උපාධි අධ්‍යයන පීඨය විසින් 2015 වර්ෂය තුළ රු.1,106,217 ක මුදලක් පීඨ මණ්ඩල හා අධ්‍යයන මණ්ඩල සාමාජිකයින් වෙත සහභාගීත්ව දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති වැටුප් හා දීමනා වලට අමතරව මහා භාණ්ඩාගාරයෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විධිමත් අනුමැතියකින් තොරව උපාධි අධ්‍යයන පීඨය පවත්වාගෙන යන පාඨමාලා 13ක ආදායමින් එකතු වටිනාකම රු.738,750 ක මුදලක් උපාධි අධ්‍යයන පීඨ සේවකයින් 06 දෙනෙකු වෙත දීමනා ලෙස ලබාදී තිබුණි.

(ඈ) ආයතනය විසින් ස්ථාවර තැන්පතු ආයෝජන සඳහා ලැබී තිබූ පොලී ආදායමින් රු.මිලියන 25 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව වෛද්‍ය රක්ෂණ සුභසාධන අරමුදලක් වෙත මාරු කර තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහය | |
| **(i)** **XX** පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිළධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිළධාරීන් 703 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කරගත නොහැකිවීම හේතුවෙන් රු.1,232,701,445ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂාකළ නොහැකි විය. |
| **(ii)** **IX** පරිච්ඡේදයේ **2.2** වගන්තිය සහ 1993 ජුනි 21 දිනැති අංක 575 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | සතිඅන්ත හා රජයේ නිවාඩු දිනයන්හි රාජකාරි කටයුතු සිදුකිරීම සඳහා ගෙවීම් කිරීමේදී විධිවිධානවලට අනුකූල නොවන පරිදි ස්ථාවර දීමනාවක් ලබාදීම හේතුවෙන් රු.298,743ක දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ **XIII** පරිච්ඡේදයේ 99(1) | විශ්වවිද්‍යාලය විසින් පවත්වාගත යුතු අරමුදලට අමතරව වෙනත් අරමුදල් 84 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ විධිමත් අනුමැතියකින් තොරව එකතු වටිනාකම රු.201,997,336 ක් එකී අරමුදල් වලට මාරු කර තිබුණි. |
| (ඇ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02 / 2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ඒකාබද්ධ අරමුදලින් ලබාදෙන ප්‍රතිපාදන පර්යේෂණ වියදම් සඳහා වැය නොකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ඒකාබද්ධ අරමුදලින් විශ්වවිද්‍යාලය වෙත ලැබුණු ප්‍රතිපාදන තුළින් රු.3,824,931 ක පර්යේෂණාධාර ලබාදී තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි අංක 371 | **(i)** අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා වියයුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 29 දෙනෙකු වෙත අවස්ථා 128ක දී එකතු වටිනාකම රු.2,140,650ක අත්තිකාරම් ලබාදී තිබුණි.<br>**(ii)** අදාල කාර්යය නිමකල විගසම අත්තිකාරම් |

පියවිය යුතු වුවත් අවස්ථා 15ක දී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු.2,707,277 ක අත්තිකාරම් ලබාදී දින 34 සිට දින 279 දක්වා කාලයක් ගතවී තිබුණ ද පියවීමට කටයුතු කර නොතිබුණි.

**(iii)** නිසි ලෙස පුරෝකථනය කළ වැය ඇස්තමේන්තුවක් මත පමණක් අත්තිකාරම් ලබාදීම සිදු කළ යුතු වුවත් එවැන්නකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් රු.158,201 ක වියදම් සඳහා අවස්ථා 23 ක දී රු.460,625 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ඉ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් වටිනාකම රු.100,000 ක් වුවත් ආයතනය විසින් අවස්ථා 17ක දී චක්‍රලේඛ විධිවිධාන අභිබවා රු.105,000 සිට රු.300,000 දක්වා පරාසයක් තුළ අත්තිකාරම් ලබා දී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2015** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.326,038,151 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.372,221,037 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.46,182,886 කින් පිරිහී තිබුණි. රජයේ ප්‍රදාන රු.467,055,692 කින් වැඩි වී තිබුණද වැටුප් හා වේතන වියදම් රු.400,333,561 කින් හා අනෙකුත් පොදු කාර්ය වියදම් රු.130,653,265 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී ආයතනයේ අතිරික්තය සියයට 52 ක අඩුවීමක් පෙන්නුම් කළද 2013 සහ 2014 වර්ෂ වල අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර නැවත 2015 වර්ෂයේදී සුළු අඩුවීමක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2011 වර්ෂයේ සිටම අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර එය 2014 හා 2015 වර්ෂවල පිළිවෙලින් රු.2,302,710,443 ක් හා රු.2,629,543,494 ක් වී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දායකත්වයේ වැඩිවීම සියයට 14 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේ ආරම්භ කරන ලද සීඩා සරෙක් ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී අවසන් වී තිබු නමුත් ව්‍යාපෘතියට අදාල ගිවිසුමේ 7 වැනි වගන්තිය ප්‍රකාරව ගිවිසුම් හා කාර්ය අවසන් වූ පසු

ඉතිරියක් වේ නම් ස්වීඩන් රජයට ලබාදිය යුතු වුවත් ව්‍යාපෘතියේ අතිරික්තය වු රු.2,543,154 ක මුදල විශ්වවිද්‍යාලය විසින් තවදුරටත් රඳවාගෙන තිබුණි.

(ආ) පීඨයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ අධ්‍යයන අධ්‍යක්ෂ නමින් තනතුරක් ඇතිකර මාසයකට රු.15,000 බැගින් සමාලෝචිත වර්ෂය තුළ රු.165,000 ක දීමනා ලබාදී තිබුණි. මෙම දීමනාව ගෙවීම සඳහා ආචාර්යවරිය වෙත පවරා ඇති කාර්යයන් පිළිබඳව ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ඇ) ඉදිකරමින් පවතින උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිල්ලේ සුපරීක්ෂණ කටයුතු සිදු කළ බව සඳහන් කරමින් පීඨයේ ලේඛකාධිකාරීවරයා විසින් මාසයකට රු.35,000 බැගින් සමාලෝචිත වර්ෂය තුළ රු.210,000 ක දීමනාවක් ලබාගෙන තිබුණි. ලේඛකාධිකාරීවරයා ඉදිකිරීම් කටයුතු සුපරීක්ෂණය සිදු කල ආකාරය හා සුපරීක්ෂණය තුළ වු නිරීක්ෂණයන් සම්බන්ධ කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබියදී ඉහත ගෙවීම සිදුකර තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය තුළ පරිගණක යෙදවුම් සහකාර තනතුරක සේවය කල පුද්ගලයෙකු විසින් ව්‍යාජ විභාග ප්‍රතිඵල සහතික සැකසීම හේතුවෙන් ඔහුට එරෙහිව 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත හා දණ්ඩ නීති සංග්‍රහය අනුව නීත්‍යානුකූලව කටයුතු කර දන්වන ලෙස විභාග කොමසාරිස්වරයා විසින් ලේඛකාධිකාරීවරයා වෙත දන්වා ඒවා ඇතත් එසේ නීත්‍යානුකූලව කටයුතු කිරීමකින් තොරව ඔහුව සේවයෙන් ඉවත්කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගිවිසුම් හා බැඳුම්කර කඩකල ආචාර්යවරුන් 31 දෙනෙකුගෙන් විශ්වවිද්‍යාලය වෙත රු 36,019,234 ක් ලැබිය යුතුව තිබුණු අතර මෙම ශේෂයෙන් 2010 වර්ෂයට පෙර ගිවිසුම් කඩ කර ඇති ආචාර්යවරුන් 07 දෙනෙකුගෙන් රු.1,892,022 ක මුදලක් අයවිය යුතුව ඇතත් ඔවුන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද 2010 වර්ෂයෙන් පසුව ඇති කරගත් ගිවිසුම් තුළ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් ගිවිසුම් ගත මුදල් අයකර ගත හැකි බවට කොන්දේසියක් ඇතුළත් වුවද එම කොන්දේසිය ඇතුළත් ගිවිසුම් 2 ක් කඩකර වසර 03 කට අධික කාලයක් ගතවී ඇතත් අයවිය යුතු රු 3,561,741 ක් අදාළ ආචාර්යවරුන්ගේ අර්ථසාධක අරමුදල් වලින් අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.2 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රදාන ගිණුමෙහි ආරම්භක ශේෂය රු.41,618,780ක් පැවතියදී රු.28,404,075ක වැය දැරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් රු.55,000,000 ක් ලබාගෙන තිබුණි. නිසි ඇස්තමේන්තුවකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් එම ගිණුමෙහි රු.68,214,705ක ශේෂයක් ඌන උපයෝජිතව පවතින බව අනාවරණය විය.

(ආ) ප්‍රාග්ධන වැය තුළ වූ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.25,000,000 ක ප්‍රාග්ධන ප්‍රදානයන් ලබාගෙන තිබු නමුත් රු.209,750 ක් පමණක් වැයකර තිබුණි.

(ඇ) පිරිසිදු කිරීමේ ගිවිසුමට අනුකූලව පිරිසිදු කිරීමේ කටයුතු වලට දායක වූ සේවක සංඛ්‍යාව හා සේවය කල දින ගණන අනුව ගෙවීමට එකඟ වී ඇති අනුපාත පදනම් කරගෙන පිරිසිදු කිරීමේ ආයතනයන්ට ගෙවිය යුතු මුදල ගණනය කල යුතු නමුත් ඊට අනුකූල නොවන සේ ගෙවීම් කිරීම හේතුවෙන් නියැදි පරීක්ෂාවට අනුව එක් මාසයක් සඳහා එක් එක් පීඨයන්ට

අදාල පිරිසිදු කිරීමේ ගිවිසුම අනුව ගෙවිය යුතු මුදල හා ගෙවූ මුදල් අතර රු.1,124,240ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) පර්යේෂණාධාර ලබාගන්නා ආචාර්යවරුන් පර්යේෂණ යෝජනාවෙහි වූ දිනයන්හිදී සිය පර්යේෂණය අවසන්කොට අවසන් පර්යේෂණ වාර්තාව ලබාදිය යුතු වුවත් එකතු වටිනාකම රු.9,136,737 ක පර්යේෂණාධාර ලබාගෙන තිබූ ආචාර්යවරු 12 දෙනෙකුට අදාලව අවසන් පර්යේෂණ වාර්තාව ලබාදිය යුතු දිනය ඉක්මවා අවුරුද්දක් ගතවී තිබුණද අවසන් පර්යේෂණ වාර්තා ලබාදී නොතිබුණි.

(ඉ) විවිධ හේතු මත විශ්වවිද්‍යාල සේවයෙන් ඉවත් වී ඇති සේවකයින් 14 දෙනෙකුගෙන් ලැබිය යුතු ණය ශේෂය රු.1,243,481 ක් වන අතර අවුරුදු 5ත් 10ත් අතර දිර්ඝ කාලයක සිට පැවත එන මෙම ණය ශේෂ අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

## 4.3 හඳුනාගන්නා ලද පාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භෞතික පොත් පරීක්ෂාවට අනුව රු.3,292,524 ක් වටිනා පොත් 27,367 ක් අස්ථාන ගත වී තිබුණි. මෙම පොත් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන තුළ කිසිදු ගැලපීමක් ද සිදුකර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

විශ්වවිද්‍යාල අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු 362 ක් පැවතියදී පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 103 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.27,804,822 ක වැටුප් ගෙවා තිබුණි. බොහෝ සේවකයින්ගේ කොන්ත්‍රාත් කාලය අවුරුදු 5 ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | චෙක්පත් අවලංගු කිරීම, නැවත නිකුත් කිරීම හා ආදායමට ගැනීම දුර්වල මට්ටමක පැවතීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | අදාල ලිපිගොනු විධිමත්ව නඩත්තු නොකිරීම සහ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම.<br>රැඳවුම් මුදල් සම්බන්ධ විධිමත් ලේඛනයක් පවත්වාගෙන නොයෑම. |
| (ඇ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | දේපළ අයිතිය තහවුරු කර නොගැනීම, නඩත්තු කිරීම හා අපහරණය පිළිබඳ දුර්වලතා පැවතීම. |

| | | |
|---|---|---|
| (ඇ) | ණයගැති හා ණයහිමි පාලනය | ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. |
| (ඉ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ පටිපාටිය නිසි පරිදි අනුගමනය නොකිරීම, අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම සටහන් නොකිරීම |
| (ඊ) | පුස්තකාල පරිපාලනය | විධිමත් පරිදි භාණ්ඩ සමීක්ෂණ නොකිරීම, අස්ථානගතවීම් හා සංසන්දනාත්මක ලේඛන විධිමත්ව පවත්වාගෙන නොයාම. |